www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ගෝලීය අර්බුදයට චීනය ප්‍රතිකර්ම නොකරනු ඇත

**China offers no fix for global slump**

**2009 මාර්තු 21**

ලෝක ආර්ථිකය ගැඹුරු පසුබෑමෙන් ගොඩගත හැකි, ආර්ථික වර්ධනයේ එංජිම චීනය වනු ඇති බවට පැවති සියලු බලාපොරොත්තු, නවතම ලෝක බැංකු පෙරදැකීම් මගින් පසෙකට දමා ඇත.

මෑතක දී නිමාව දුටු ජාතික මහජන සමුලුවේ දී (එන්පීසී) චීන අගමැති වෙන් ජියාබාවෝ, 2009 වසර තුල වර්ධන වේගය සියයට 8 වනු ඇතැයි සහතික විය. කෙසේ වුව ද ලෝක බැංකුව මෙම වසර සඳහා මුලින් පලකොට තිබුනු අනාවැකිය සියයට 7.5 සිට දැන් සියයට 6.5 දක්වා කප්පාදු කොට ඇත.

එක්සත් ජනපදය, යුරෝපය හා ජපානය යන සියලු තැන්වල පසුබෑමක් පවතින තතු තුල සියයට 6.5 වර්ධන අනුපාතය පවා බලාපොරොත්තු දල්වන සුලුය. පොදුවේ ශුභවාදී හඬක් නංවන බැංකුවේ දසුන පිලිබිඹු කරමින් ලෝක බැංකුවේ දේශීය අධ්‍යක්ෂ ඩේවිඩ් ඩොලර්, චීනය ගැන මෙසේ සඳහන් කරයි. ''නොඑසේ නම් අඳුරු ගෝලීය ආර්ථිකය තුල, සාපේක්ෂව දීප්තිමත් ලක්ෂයකි.''

කෙසේ වුව ද චීනයේ ආර්ථික පල්ලම් බැසීමෙහි සැබෑ තත්වය හා පරිමාව, බලාපොරොත්තු වන වර්ධනයෙන් සියයට 4.9 ම ලඟා කර ගන්නේ ආන්ඩුවේ දැවැන්ත උත්තේජක වැඩ සටහනෙන් ය යන කාරනයෙන් පිලිබිඹු කෙරෙයි. වෙනත් වචනවලින් කිවහොත්, උත්තේජක පියවර නොමැතිවූයේ නම්, අපේක්ෂිත වර්ධන අනුපාතය 2007 වසරේ පැවති සියයට 13 හා සසඳන කල, යාන්තම් සියයට 1.6 පමනක් වන බවයි.

ඩොලර් බිලියන 585 චීන උත්තේජක වැඩ සටහන පිලිබඳ ලෝක බැංකුවේ ගනන් බැලීම් සාක්ෂාත් වීම සැක සහිතය. පෙබරවාරියේ රාජ්‍ය බැංකු නය මුදාහැරීම වසරකට පෙර පැවතියාට වඩා ජනවාරියේ සියයට 21.3 ද පෙබරවාරියේ බිලියන 147 ක් වූ සියයට 24 ද ඉහල ගියේය. කාර්මික වර්ධනය මන්දගාමීව ඇති අතර පුද්ගලික ආයෝජන මුලුමනින්ම පාහේ එක තැන පල් වෙයි. අනාගතය පිලිබඳ මඳ විශ්වාසයක් සහිත බොහෝ සමාගම් පහසු නය යොදා ගන්නේ කොටස් වෙලඳපොලවල සමපේක්ෂනය සඳහාය. වර්ධනයේ එකම ක්ෂේත්‍රයන් ලෙස ඇත්තේ දැවැන්ත රාජ්‍ය ව්‍යවසායන්හි හා යටිතල පිරිවැය මගින් කෙරෙන ප්‍රාග්ධන වියදම් ය.

චීනයේ කැපී පෙනෙන ආර්ථික වර්ධනයේ ප්‍රධාන එංජිම වන එහි සුවිශාල නිර්යාත ක්ෂේත්‍රයේ වැඩිහරියක් වේගයෙන් ඇනහිටිමින් තිබෙන බවට සෑම සලකුනක් ම ඇත. බදු සහන හා ආන්ඩුවේ අනෙකුත් ආධාර තිබියදී ම අපනයන, පෙබරවාරියේ දී, පෙර වසරට වඩා සියයට 25.7 කඩා වැටුනේ සියයට 1 වර්ධනයක් පිලිබඳව තිබූ බලාපොරොත්තු සුන් කරමිනි. තව ද ආනයන ජනවාරියේ සියයට 43.1 හා පෙබරවාරියේ 24.1 ද පහත වැටුනේ ව්‍යාපාරයන්ගේ ආර්ථික අපේක්ෂා බොඳවී යන තතු තුල යන්ත්‍රෝපකරන, අමතර කොටස් හා අමුද්‍රව්‍ය මිලට ගැනුම් තියුනු ලෙස කපාහැරීමත් සමගය.

පෙබරවාරියේ පහතට ම වැටුනු අපනයන, 2009 දෙවන භාගය තුල ගෝලීය ආර්ථිකයේ ඉල්පීමත් සමඟ යථා තත්වයට පත්වනු ඇතැයි ද ලෝක බැංකු ප්‍රස්ථාරයෙන් අභ්‍යුපගමනය කෙරෙයි. මෙය අඳුරේ සිට පිහියෙන් ඇනීමට මඳක් වැඩි දෙයකි. 2009 ලෝක ආර්ථිකය පිලිබඳව මෙම සතියේ නිකුත් කල සිය අලුත්ම වාර්තාවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අනාවැකි පලකර ඇත්තේ සියයට 0.5-1 අතර හැකිලීමක් බලාපොරොත්තු වන බවට ය. චීනයේ ප්‍රමුඛ වෙලඳපොලවල් වන දියුනු ආර්ථිකයන්හි තත්වය වඩාත් අසාධ්‍යය. එහි සමස්ත වැටීම සියයට 3 - 3.5 අතර වනු ඇතැයි අපේක්ෂිතය. ඒ, සය මසකටත් අඩු කාලයක් තුල ජාමූඅ පහත වැටීම පිලිබඳව නිකුත් කල සිව්වන සංශෝධනයයි.

ධනේශ්වර වෙලඳපොලේ විශේෂයෙන් ම, ආසියාවේ අප්‍රිකාවේ හා ලතින් ඇමරිකාවේ ඊනියා නැගී එන ආර්ථිකයන්හි ධනේශ්වර වෙලඳපොලේ විශ්මය පිලිබඳ දිදුලන නිදසුනක් ලෙස දශකයකටත් වැඩි කාලයක් තිස්සේ චීනය හුවා දක්වා තිබේ. එහි නැඟීම නතර කල නොහැක්කක් ලෙස පෙනී ගියේය. දැවැන්ත වෙලඳ අතිරික්තයන් හා විදේශ මූල්‍ය සංචිත සහිත එක්සත් ජනපදයට හා ජපානයට පසු පසින් සිටින ලෝකයේ තෙවන විශාලතම ආර්ථිකය බවට චීනය පත්වූයේ 2007 වසරේ දී ය.

අවමුඛ අර්බුදයෙන් 2007 වසරේ දී එක්සත් ජනපදයට පහර වැදුනු අවස්ථාවේ, චීන මධ්‍යම බැංකු අධිපති ෂෝවු චියෝචුආන් ප්‍රකාශ කලේ චීන නිර්යාතවලට ඇති විය හැක්කේ ''සුලු බලපෑමක්'' පමනක් බවයි. පසුගිය ඔක්තෝබරයේ ලෝක මූල්‍ය

පද්ධතිය බිඳ වැටීමේ අද්දරට පැමිනි අවස්ථාවේ *ෆිනැන්ෂල් ටයිම්ස්* පත්‍රය, ''ඇමරිකාව ගලවාගැනීමේ'' චීන ''ක්‍රියාකාරී සැලැස්මක්'' ගෙනහැර දක්වමින් බීජිනය පනවනු ලැබිය හැකි දේශපාලන කොන්දේසි මත සමපේක්ෂනයක යෙදුනි.

කෙසේ වුව ද මේ සියල්ල පදනම් වූයේ, ''චීනය'' ස්වාධීන ආර්ථික ඒකකයක් ලෙස ක්‍රියාත්මක වන්නේය යන වැරදි ගනන් බැලීම් මතය. චීන ආර්ථිකය ලෝක ආර්ථිකයෙන් නොවෙන්කල හැකි අංගයකි. පසුගිය දශක තුන පුරා සිදු වූ නිෂ්පාදනයේ භූගෝලීයකරන ක්‍රියාවලිය, එරට ජාත්‍යන්තර සංගතයන් සඳහා තුට්ටු දෙකේ යෝධ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කලේය. චීන ''නිර්යාතයන්ගෙන්'' සැලකිය යුතු කොටසක් එකම සංගතයක් ඇතුලත, භූදෙක් භූගෝලීයව භාන්ඩ එහා මෙහා කිරීමේ ක්‍රියාදාමයට සම්බන්ධ විය.

සමීපව විමසා බැලීමේදී පෙනී යන්නේ, එකසත් ජනපදය තුල මූල්‍ය සමපේක්ෂනයේ මධුපානෝත්සවය තුලත්, චීනය ලෝකයේ ශ්‍රම වෙලඳපොල බවට පත්වීමත් යන එකම කාසියේ දෙපැත්ත, සමීප ලෙස එකට බැඳී ඇති බවයි. පහත වැටෙන ලාභානුපාතිකයන් මඟින් දුවවනු ලැබූ එක්සත් ජනපද සමාගම් සිය නිෂ්පාදන වියදම් කපාහැරීමේ අරමුනෙන් චීනය වෙත හැරුනි. අනෙක් අතට චීනයේ ලාභ භාන්ඩ එක්සත් ජනපදයේ මූර්ත වැටුප් හා උද්ධමනය අවම තලයක පිහිටුවා ගැනීම මඟින් සමපේක්ෂන ලාභ ගැරීමේ දැවැන්ත ප්‍රසාරනයක් සඳහා පදනම දැමීය. චීන භාන්ඩ සඳහා වෙලඳපොලක් පවත්වා ගැනීමට ඉඩ සලසමින් පාරිභෝගික නය ප්‍රසාරනය කරනු ලැබිනි. චීනයේ වෙලඳ අතිරික්තය යලි එක්සත් ජනපදය තුලම ආයෝජනය කරනු ලැබුවේ යුආන් මුදලේ අගය ඉහල නැගීම වලක්වා ගැනීමටත් දැවැන්ත එක්සත් ජනපද නය සඳහා මුක්කුව දීමටත් ය.

මෙම ක්‍රියාවලිය සදාකාලයට ම ඉදිරියට යන බවක් පෙනී ගියේය. සමපේක්ෂන බුබුල බිඳ වැටුනු සෑම අවස්ථාවක ම, දිගටම පවතින ලාභ භාන්ඩ දහරාව උද්ධමනය ඉහල යාම පාලනය කරනු ඇතැයි යන විශ්වාසයෙන් යුතුව එක්සත් ජනපද මහ බැංකුව එයට ප්‍රතිචාර දැක්වූයේ, මූල්‍ය වෙලඳපොලට තව තවත් මුදල් පොම්ප කිරීමෙනි. අසාමාන්‍ය මූල්‍ය උත්පාදනයන් හා වත්කම් ගොනු රූපයෙන් ව්‍යාජ ප්‍රාග්ධනය කඳු ගැසීමේ පදනම මත දැවැන්ත ලාභ උපයාගනු ලැබින. මෙම අඩමාන වැලි මාලිගයේ සමස්තය ම දැන් බිඳගෙන වැටෙමින් තිබේ.

එක්සත් ජනපදයේ හා යුරෝපයේ පාරිභෝගික වියදම් තියුනු ලෙස හැකිලී යාමත් සමඟ අපනයනවල විනාශකාරී වැටීමේ ප්‍රතිපල වශයෙන් චීනය පසුබෑමකට මුහුනපා සිටියි. චීනය පමනක් නොව නිර්යාත මත පදනම්ව ඇති ආසියානු ආර්ථිකයන් සියල්ලමත් මේ සන්තෑසියට මුහුනපා සිටියි. චීන කම්හල්වලට උපාංග, අමුද්‍රව්‍ය හා ප්‍රාග්ධන භාන්ඩ සපයනු ලැබූ, වරෙක පැවති අන්තර් ආසියානු වෙලඳ උත්පාතය ද පුපුරා යමින් තිබේ. ජපානය, තායිවානය, දකුනු කොරියාව, හොංකොං හා සිංගප්පූරුව යන සියල්ල නිල වශයෙන් පසුබෑමකට මුහුන දී සිටියි.

එක්සත් ජනපදයේ බැඳුම්කර හා අනෙකුත් සුරැකුම්වල අති විශාල චීන ආයෝජනයන් පිලිබඳව දැන් ප්‍රශ්නාර්ථය නැඟී තිබේ. එක්සත් ජනපද විදේශ සම්බන්ධතා කමිටුව මෑතක කල අධ්‍යයනයක ගනන් බැලීම්වලට අනුව, චීනයේ විදේශ මූල්‍ය සංචිත ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 2.4 ක් තරම් වනු ඇත. ඉන් ට්‍රිලියන 1.5-1.7 අතර ප්‍රමානයක් තබාගෙන ඇත්තේ විවිධාකාර ඩොලර් වත්කම් ලෙසය. ඩොලරය වැටී ගිය හොත් චීනයේ ආයෝජනවල සුරක්ෂිතභාවය පිලිබඳව පසුගිය සතියේ දී අගමැති වෙන් ප්‍රසිද්ධියේ ම සිය කනස්සල්ල පල කලේය. එම බිය තුරන් කිරීම සඳහා මෙම සතියේ දී එක්සත් ජනපද ෆෙඩරල් මහ බැංකුව, එරට නය සඳහා ගෙවීමට, සාරය වශයෙන් ගත් කල බිලියන 300 ක මුදල් අච්චු ගැසීමේ සැලැස්මක් නිවේදනය කලේය.

චීනය බන්ධනයකට සිරවී සිටියි. එක්සත් ජනපද ඩොලරය කඩා වැටුන හොත් බීජිනය, තමන්ගේ මූල්‍ය හා බැංකු පද්ධතිය අස්ථාවර කරන අලාභයන්ට මුහුනපානු ඇත. අනෙක් අතට එය, තමන් සතු එක්සත් ජනපද ආයෝජන ඉවත් කර ගත හොත්, එරටෙහි පමනක් නොව ගෝලීය මූල්‍ය පද්ධතිය කෙරෙහි ම ව්‍යසනකාරී ප්‍රතිවිපාක ගෙන එන එක්සත් ජනපද වත්කම් අත්හැර දැමීමේ ගෝලීය කලබැගෑනියක් බීජිනය විසින් මුදා හැරියා වනු ඇත.

ජාතික මහජන සමුලුව ඇමතීමේ දී චීන නායකයෝ, ගැඹුරුවන ආර්ථික අර්බුදය හමුවේ හැකිතාක් හොඳ මුහුනක් පෙන්වීමේ උත්සාහයක නිරත වූහ. චීන තන්ත්‍රයේ උත්තේජක පියවර හා නිවේදනය කර ඇති නව සමාජ ශුභසාධන සැලසුම් ක්‍රියාවට නැගෙන විට සියයට 8 වර්ධන වේගයක් අත්කර ගනු ඇතැයි වෙන් නියෝජිතයන් වෙත සහතික විය. රැස්ව සිටි සියල්ලන් හොඳින්ම දන්නා කාරනය නම් සියයට 8 අඩු ඕනෑම තත්වයක අර්ථය වන්නේ විරැකියාව වැඩීයාම හා සමාජ නොසංසුන්තාවය බවයි. දැනටමත් ගම්වලින් සංක්‍රමනයවූ මිලියන 20 කම්කරුවන්ගේ රැකියා අහිමි වී ඇති අතර නාගරික කම්කරුවන්, විශ්ව විද්‍යාල උපාධිධාරීන් හා මිලිටරියෙන් ඉවත් වූ සොල්දාදුවන්ගේ හමුදාවකට ම රැකියා සොයාගත නොහැකි වී ඇත.

ජාතික මහජන සමුලුවට ඉදිරිපත් කල අයවැය ලේඛනය තුල වැලලී ගිය එක් වැදගත් අයිතමයක් වූයේ ඩොලර් බිලියන 71 වඩා සියයට 20.5 ඉහල නැංවූ දැවැන්ත මහජන ආරක්ෂක වියදමයි. එම සංඛ්‍යාව 2009 වසර සඳහා චීනයේ මුලු මිලිටරි පිරිවැය වන බිලියන 70.2 වඩා වැඩිය. වෙන් ඇල්මැරුනු ස්වභාවයෙන් නියෝජිතයන්ට පැවසුවේ ''සමාජ ස්ථාවරත්වය සඳහා සියලු ම වර්ගයේ මහජන කැලඹිලි මනාව හැසිරවීමට හා ක්ෂනිකව මැඩපැවැත්වීම සඳහා අපි, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය වැඩි වර්ධනය කරන්නෙමු.'' අරමුන ඕනෑවටත් වඩා පැහැදිලිය. ''චීන විශ්මයේ'' කඩ ඇනය වී ඇත්තේ, සියලු විවේචන, දේශපාලන විරුද්ධත්වය, විරෝධතා හා වැඩ වර්ජන මැඩීමේ පැතිර පවතින පොලිස්-රාජ්‍ය පද්ධතියයි.

එක්සත් ජනපද, යුරෝපීය හා ජපාන ප්‍රකාශකයන්, වතාවතක් ලෙස ම චීනයේ ප්‍රසාරනය වන මිලිටරි විදම්වල අර්ථය ප්‍රශ්නයට බඳුන් කරති. එහෙත් ඒ කිසිවෙකුටත් මහජන ආරක්ෂක වැය පිලිබඳව කීමට කිසිවක් ඇත්තේ නැත. ජාත්‍යන්තර මූල්‍ය කවයන්, චීනයේ සමාජ කැලඹීම් ආර්ථිකව මෙන්ම දේශපාලනිකව ද ලොව පුරා දෝංකාරය නංවනු ඇතැයි යන්න ඕනෑවටත් වඩා හොඳින් වටහාගෙන සිටියි.

**ජෝන් චෑං**

© www.wsws.org